සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

## ලංකා ඉතිහාසය I

කාලය පැය එකයි.

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

**1 කොටස**

- **අංක 01 සිට 05 තෙක් වූ ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

01. 1. සද්ධර්මාලංකාරය 2. නිකාය සංග්‍රහය 3. මයුර සන්දේශය
    4. තිසර සන්දේශය 5. හංස සන්දේශය (.....)

02. 1. මුල්ලේරියා සටන 2. දන්තුරේ සටන 3. බලන සටන
    4. රන්දෙණිවෙල සටන 5. ගන්නෝරුව සටන (.....)

03. 1. මැකලම් 2. කෝල්බෲක් 3. ඩොනමෝර්
    4. මැකන්සි 5. සෝල්බරි (.....)

04. 1. බූටෑවේරාළ 2. වීරපුරන් අප්පු 3. කොහුකුඹුරේ රාළ
    4. කිවුලේ ගෙදර 5. මඩුගල්ලේ (.....)

05. 1. පලෙසිමුණ්ඩො 2. සෙරන්ඩිබ් 3. ජම්බුද්‍රෝණි
    4. තැප්රොබේන් 5. පාරසමුද්‍ර (.....)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06. 1. ගෝඨාභය රජු - මේඝවණ්ණ අභය
2. පළමුරාජසිංහ රජු - ටිකිරි කුමරයා
3. පළමුවන විජයබාහු රජු - කිත්තිකුමරු
4. නවවන ධර්ම පරාක්‍රමබාහු රජු - අම්බුලුගල කුමරු
5. හයනන බුවනෙකබාහු රජු - සපුමල් කුමරු (.....)

07. 1. ධාතුසේන රජු - කලාවැව කරවීම
2. මහසෙන් රජු - සුරුල්ලවාපී කරවීම
3. පළමු පැරකුම් රජු - බැන සමුද්‍රය කරවීම
4. නිශ්ශංකමල්ල රජු - පාණ්ඩිවිජය කුලම් වැව
5. කල්‍යාණවති රැජින - බතලගොඩ වැවකරවීම (.....)

08. 1. පරම විඥනාර්ථ සමාගම - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
2. හලාවත සංගමය - ඩී.බී. ජයතිලක
3. ලංකා ජාතික සංගමය - පොන්නම්බලම් අරුණාචලම්
4. ද්‍රවිඩ සංගමය - ජී.ජී. පොන්නම්බලම්
5. ලංකා කම්කරු සංගමය - ඒ.ඊ. ගුණසිංහ (.....)

09. 1. මිරිසවැටි දාගබ - දේවානම්පියතිස්ස රජු
2. ලෝවාමහාපාය - දුටුගැමුණු රජු
3. ජේතවනාරාමය - මහසෙන් රජු
4. අභයගිරිය - වළගම්බා රජු
5. සෝමාවතිය - ගිරිඅභය රජතුමා (.....)

10. 1. මහ බද්ද - කුරුඳු දෙපාර්මේන්තුව
2. කුරුවෙ බද්ද - අලි ඇතුන් පිළිබඳ දෙපාර්මේන්තුව
3. මඩිගෙ බද්ද - ප්‍රවාහන දෙපාර්තමේන්තුව
4. කින්නර බද්ද - වෙළෙඳ දෙපාර්තමේන්තුව
5. කොට්ටල් බද්ද - ශිල්පීන් පිළිබඳ දෙපාර්තමේන්තුව (.....)

- **අංක 11 - 15 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට හිමි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

11.

| X | | Y |
|---|---|---|
| 1. පූජාවලිය | A | අනෝමදස්සි හිමි |
| 2. දෛවඥකාම ධේනු | B | නන්නූර්තුනෙයාර් |
| 3. එළුබෝධි වංසය | C | වීදාගම මහා මෛත්‍රිය හිමි |
| 4. හංස සන්දේශය | D | බුද්ධ පුත්‍ර හිමි |
| 5. පුරාණ නාමාවලිය | E | විල්ගම්මුල ශ්‍රී පරාක්‍රමබාහු හිමි |

1. ADECB 2. DAECB 3. DACBE 4. ECBDA 5. DEABC (.....)

12.

| X | | Y |
|---|---|---|
| 1. දෙවන පැරකුම් | A | විජයබා කොල්ලය |
| 2. අටවන වීර පරාක්‍රමබාහු | B | කාලිංග මාඝ පරාජය කිරීම |
| 3. හයවන විජයබාහු | C | ජෝතිය සිටාණන්ගේ කැරැල්ල |
| 4. තුන්වන වික්‍රමබාහු | D | ආර්ය චක්‍රවර්තියේ ආක්‍රමණය |
| 5. හයවන පැරකුම් | E | පෘතුග්‍රීසි ලංකාවට පැමිණීම. |

1. EBADC 2. BAEDC 3. CDACB
4. ABEDC 5. BEADC (.....)

13.

| X | | Y |
|---|---|---|
| 1. 1818 පළමු නිදහස් අරගලය | A | පොල්ගස් බද්ද |
| 2. 1848 දෙවන නිදහස් අරගලය | B | ටෙරින්ටන් සාමිගේ බදු ප්‍රතිපත්තිය |
| 3. 1797 - 1798 මුහුදු බඩ කැරැල්ල | C | බෞද්ධ පෙරහැරකට පහර දීම. |
| 4. 1915 කෝලාහාලය | D | උඩරට ගිවිසුම කඩකිරීම. |
| 5. 1883 කොටහේන කෝලාහලය | E | සිංහල මුස්ලිම් කෝලාහලය |

1. DBAEC 2. AECDB 3. DBECA
4. CEABD 5. ADBCE (.....)

14.

| X | | Y |
|---|---|---|
| 1. ධාතුසේන රජු | A | දඹදෙණි පෙළපත |
| 2. වසභරජු | B | ලම්භකර්ණ පෙළපත |
| 3. පස්වනසේන රජු | C | මෞර්ය රාජවංශය |
| 4. පළමුවන බුවනෙකබාහු | D | නායක්කර් පෙළපත |
| 5. රාජධිරාජසිංහ රජු | E | මානවම්භ පෙළපත |

1. BECAD 2. CBEDA 3. CBEAD
4. EBCAD 5. DACBE (.....)

15. X Y

1. කැරගල A සනානන්ද පිරිවෙන
2. තොටගමුව B ධර්මරාජ පිරිවෙන
3. වීදාගම C විජයබා පිරිවෙන
4. දෙවිනුවර D ඉරුගල්කුලතිලක පිරිවෙන
5. එරබත්තොට E පද්මාවතී පිරිවෙන

1. ECDAB 2. CEADB 3. CADEB
4. ECADB 5. ADECB (.....)

- **අංක 16 - 20 තෙක් ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.**

16. ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රිසි ආණ්ඩුකාරවරුන්ගේ නාමයන්හි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. ෆෙඩ්රික් නෝර්ත්, සර් තෝමස් මෙට්ලන්ඩ්, සර් රොබට් බ්‍රවුන්රිග්, සර් එඩ්වර්ඩ් බාන්ස්, සර් එඩ්වඩ් පෙජට්
   2. ෆෙඩ්රික් නෝර්ත්, සර් තෝමස් මෙට්ලන්ඩ්. සර් රොබට් බ්‍රවුන්රිග්, සර් එඩ්වඩ් පෙජට්, සර් එඩ්වඩ් බාන්ස්
   3. ෆෙඩ්රික් නෝර්ත් සර් තෝමස් මෙට්ලන්ඩ්, සර් එඩ්වඩ් පෙජට්, සර් රොබට් බ්‍රවුන්රිග්, සර් එඩ්වඩ් බාන්ස්
   4. ෆෙඩ්රික් නෝර්ත්, සර් රොබට් බ්‍රවුන්රිග්, සර් තෝමස් මෙට්ලන්ඩ්, සර් එඩ්වර්ඩ් බාන්ස්, සර් එඩ්වට් පෙජට්
   5. ෆෙඩ්රික් නෝරත්, සර් එඩ්වඩ් බාන්ස්, සර් තෝමස් මෙට්ලන්ඩ්, සර් රොබට් බ්‍රවුන්රිග් සර් එඩ්වඩ් පෙජට් (.....)

17. උඩරට පාලකයින්ගේ රාජ පද ප්‍රාප්තියට අනුව නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, කිර්ති ශ්‍රී රාජසිංහ රජු, විජය රාජසිංහ රජු. රාජාධිරාජසිංහ රජු, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
   2. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, රාජාධිරාජසිංහ රජු, විජයරාජසිංහ රජු, ශ්‍රී වික්‍රමරාජසිංහ රජු
   3. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ, ශ්‍රී විජය රාජසිංහ රජු, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ රජු, ශ්‍රී වික්‍රමරාජසිංහ රජු
   4. විජය රාජසිංහ රජු, වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, රාජාධිරාජසිංහ රජු, ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
   5. විජය රාජසිංහ රජු, කීර්ති ශ්‍රී රාජසිංහ රජු, වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු, රාජාධිරාජසිංහ රජු, ශ්‍රී වික්‍රමරාජසිංහ රජු (.....)

18. පහත සඳහන් ස්තූපයන් නිර්මාණය කරන ලද කාලය අනුව ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. මිරිසවැටිය, සේරුවාවිල මංගල සෑය, රුවන්වැලිසෑය, කණ්ඨකචේතිය, අභයගිරිය
   2. රුවන්වැලිසෑය, මිරිසවැටිය, සේරුවාවිල මංගල සෑය. කණ්ඨකචේතිය, අභයගිරිය
   3. මිරිසවැටිය, රුවන්වැලිසෑය, සේරුවාවිල මංගල සෑය, කණ්ඨකචේතිය, අභයගිරිය
   4. සේරුවාවිල මංගල සෑය, රුවන්වැලි සෑය, මිරිසවැටිය, කණ්ඨකචේතිය, අභයගිරිය
   5. සේරුවාවිල මංගල සෑය, කණ්ඨකචේතිය, මිරිසවැටිය, රුවන්වැලිසෑය, අභයගිරිය (.....)

19. කෝට්ටේ යුගයේ දී රචිත සාහිත්‍ය ග්‍රන්ථ පමණක් අඩංගු වරණය තෝරන්න.
   1. හංස සන්දේශය, කාව්‍යශේඛරය. දළදාසිරිත, ලෝකෝපකාරය, භක්තිශතකය
   2. හංස සන්දේශය, පැරකුම්බා සිරිත, කාව්‍යශේඛය, ලෝකෝපකාරය, භක්තිශතකය
   3. පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, ධාතුමංජුසාව, ලෝකෝපකාරය, භක්තිශතකය
   4. අනාගත වංසය, දළදා සිරිත, හංස සංදේහය, කාව්‍යශේඛරය, ලෝකෝපකාරය
   5. දළදා සිරිත, හංස සන්දේශය, පැරකුම්බා සිරිත, කාව්‍යශේඛරය, ලෝකෝපකාර (.....)

20. ශ්‍රී ලංකාවට එල්ල වූ ආක්‍රමණවල නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. පංච ද්‍රවිඩ, සත්ද්‍රවිඩ, රාජරාජ චෝළ, කාලිංග මාඝ, ජාවක චන්ද්‍රභානු
   2. සත්ද්‍රවිඩ, රාජරාජ චෝළ, පංචද්‍රවිඩ. ජාවක චන්ද්‍රභානු, කාලිංග මාඝ
   3. පංච ද්‍රවිඩ, රාජරාජ චෝළ, සත්ද්‍රවිඩ, කාලිංගමාඝ, ජාවක චන්ද්‍රභානු
   4. සත්ද්‍රවිඩ, පංචද්‍රවිඩ, රාජරාජ චෝළ, කාලිංග මාඝ, ජාවක චන්ද්‍රභානු
   5. පංචද්‍රවිඩ, ජාවක චන්ද්‍රභානු, සත්ද්‍රවිඩ, කාලිංග මාඝ, ජාවක චන්ද්‍රභානු (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. පළමුවැනි විමලධර්මසූරිය රජු,
   1. කොණප්පු බණ්ඩාර නමින් හැඳින්වීම.
   2. වීරසුන්දර බණ්ඩාරයේ පුත්‍රයා ය.
   3. කුසුමාසන දේවිය විවාහ කරගන්නා ලදි.
   4. ගන්නෝරුව සටන මෙහෙයවන ලදි.
   5. මහනුවර දළදා මාළිගය ඉදිරිකිරීම. (.....)

22. ලන්දේසි ආගමික ප්‍රතිපත්ති
   1. ලංකාවේ රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීම.
   2. ආගම ප්‍රචාරය සඳහා පිලිප් බැල්දියස් දේව ගැතිවරයා ලංකාවට පැමිණීම.
   3. ආගම ප්‍රචාරය සඳහා ප්‍රෙඩිරිකන්වරු වැනි නිළධාරින් පත් කිරීම.
   4. අන්‍යාගමික සිසුන් බෞතිස්මයෙන් පසු පමණක් පාසල්වලට ඇතුල් කිරීම.
   5. පාසල කේන්ද්‍රකරගෙන ආගම ඉගැන්වීම. (.....)

23. ශ්‍රී ලංකාවේ ජල තාක්‍ෂණය
   1. වැව් ඉදිකිරීම ජල තාක්‍ෂණයේ විශිෂ්ටත්වය පෙන්නුම් කෙරේ.
   2. ජයගඟ ධාතුසේන රජුගේ විශිෂ්ට ඇළ නිර්මාණයකි.
   3. උද්‍යාන නිර්මාණය පිළිබඳ අධ්‍යනයේදී සීගිරි ජල මල් උද්‍යානය ඉතා විශිෂ්ට නිර්මාණයකි.
   4. වැවේ ජලය පිටකිරීම පාලනය කිරීම සඳහා මොහොළ ඉදිකර ඇත.
   5. වැවට ලැබෙන අතිරික්ත ජලය පිටකිරීමට සඳහා සොරොව්ව ඉදිකර ඇත. (.....)

24. සිද්දි ලෙබ්බේ තුමා
   1. කොළඹ මුස්ලිම් සංගමය පිහිටවීම.
   2. සිලෝන් රිවිව් සඟරාව ආරම්භ කිරීම.
   3. සහිරා විද්‍යාලය ආරම්භ කිරීම.
   4. ඉංග්‍රීසි ඉගෙනීමේ වැදගත්කම අවධාරණය කිරීම.
   5. මද්රාසා නම් මුස්ලිම් ආගමික පාසල් ආරම්භ කිරීම. (.....)

25. සෝල්බරි ආණ්ඩුක්‍රමය
   1. 1947 දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දීම.
   2. බ්‍රිතාන්‍ය කිරීටයේ නියෝජිතයා ලෙස ආණ්ඩුකාරවරයා පත් කිරීම.
   3. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව හඳුන්වා දීම.
   4. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 101 කි.
   5. පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 05 කි. (.....)

**26 - 30 දක්වා ප්‍රශ්නවලට A,B,C, හා D යන ප්‍රතිචාර අතරින්. එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා**

Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද
C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ / ප්‍රකාශය නිවැරදි වේද?
   A) ආර්ය ජනාවාස පිහිටුවීම එකවර සිදුවූවක් නොවේ.
   B) මුල්ම ආර්ය ජනාවාස ලංකාවේ තෙත් කලාපයේ ව්‍යාප්තව පැවතුණි.
   C) බ්‍රාහ්මීය සෙල්ලිවල විහිදීම අනුව මුල් ආර්ය ජනාවාස වල විහිදීම පිළිබඳ යම් අවබෝධයක් ලබාගත හැකිය.
   D) විජය කුමරුට බිසවක ලෙස භද්දකච්චායනා දේවිය ලංකාවට සංක්‍රමණය විය. (.....)

27. මහා වංසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
   A) ලංකාවේ ඉතිරිව ඇති පැරණිතම වංසකතාවයි.
   B) මහා විහාරයේ වංසකතාව යනුවෙන්ද හඳුන්වනු ලැබේ.
   C) මහානාම හිමියන් විසින් රචනා කර ඇත.
   D) ක්‍රි.ව. 4,5 සියවස්වල මහානාම රජදවස ලියවී ඇත. (.....)

28. යාපන රාජධානිය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදිවේද?
   A) යාපනයේ මුල් රජවරු, චෝල, අධිරාජ්‍යයේ සාමාන්ත පාලකයෝ වූහ.
   B) 1617 දී පරරාජශේකරම් මරා පෘතුගීසීහු යාපනය රාජධානිය අත්පත් කරගන්නා ලදි.
   C) ශෙගරාශශේකර මාලෙ යාපන රාජ්‍යයේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධාන මූලාශ්‍රයකි.
   D) විජය කුලංකෙ යාපන රාජ්‍යයේ ප්‍රථම පාලකයා ලෙස සැලකේ. (.....)

29. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   A) ලිඛිත ඉතිහාසයක් ආරම්භ වීමට පෙර යුගය ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස හඳුන්වනු ලැබේ.
   B) විධිමත් සුසාන ක්‍රමයක් අනුගමනය කරන ලදි.
   C) කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය මාර්ගය විය.
   D) සකපෝරුව භාවිතයෙන් මැටි භාණ්ඩ නිපදවා ගැනීමට හැකියාව තිබුණි. (.....)

30. ද්විත්ව පාලන ක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේද?
   A) මදුරාසි පාලනයේ පැවැති දුර්වලතා හා ගැටලු නිසා ද්විත්ව පාලනය හඳුන්වා දෙන ලදි.
   B) කිරීටයේ නියෝජිතයා ලෙස නෝත් ආණ්ඩුකාරයා පත් කරන ලදි.
   C) ලංකාවේ පාලන කටයුතු වලින් පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම ඉවත් කිරීම.
   D) ක්‍රි.ව. 1815 දක්වා ලංකාව ද්විත්ව පාලනය යටතේ පාලනය විය. (.....)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

31. අභ්‍යන්තර අවුල් සහගත අවස්ථාවන්හිදී විදේශ රටවලින් යුධ ආධාර ලබාගත් පළමු ලාංකික පාලකයා කවුරුන්ද?
   1. මුගලන් 2. ඉළනාග 3. සිරිනාග
   4. අභයනාග 5. මානවම්භ (.....)

32. පළමු පැරකුම් රජුගේ බුරුම ආක්‍රමණය පිළිබඳ තොරතුරු අනාවරණයවන අභිලේඛනය කුමක්ද?
1. දෙවනගල ලිපිය 2. අඹගමු ලිපිය 3. වේලක්කාර ලිපිය
4. සංගමු ලිපිය 5. බතලේගොඩ ලිපිය (.....)

33. ලංකාධිපත්‍ය නම් කෘතියේ කතුවරයා කවුරුන් ද?
1. ජ්ලීන් 2. දකුටෝ 3. රිබෙයිරෝ
4. ටෙනන්ට් 5. මේජර් ඩේවි (.....)

34. ලංකා ජාතික සංගමයේ ආරම්භක සභාපතිවරයා කවුරුන්ද?
1. එෆ්.ආර්. සේනානායක 2. සර්.ඩී.බී. ජයතිලක 3. ඩී.එස්. සේනානායක
4. පොන්නම්බලම් රාමනාදන් 5. පොන්නම්බලම් අරුණාචලම් (.....)

35. රන්දෙනිවෙල සටනේ දී පෘතුගීසීන් වෙනුවෙන් සටන් මෙහෙයවා පරාජයට පත්වූ කපිතාන් ජනරාල්වරයා කවුරුන්ද?
1. ලොරෙන්සෝ ද අල්මේදා 2. පෙරෝ ලෝපෝස් ද සූසා
3. කොන්ස්තන්තීනු ද සා නොරොඤ්ඤා 4. දියෝගු මේලෝ ද කැස්ත්‍රෝ
5. දොන් ජෙරනිමෝ ද අසවේදු (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| **පළමුවන ප්‍රකාශය** | **දෙවන ප්‍රකාශය** |
|---|---|
| 36. කැළණි මිටියාවත් දුම්රිය මාර්ගය මඩකලපු වරාය සමග වතුකරයට සම්බන්ධ කළ ප්‍රධාන වාණිජ්‍ය ගමන් මාර්ගය විය. | නිශ්ශංකමල්ල රජුගේ රාමේෂ්වරම් ආක්‍රමණය පිළිබඳ තොරතුරු දෙවනගල ලිපියේ දැක්වේ. (.....) |
| 37. රටේ සියලු ඉඩම් රජුට හිමි වූ බැවින් ඔහු භූපති නමින් හැඳින්වේ. | 1810 වර්ෂයේ දී අපරාධ නඩු සම්බන්ධයෙන් ජූරිසභා ක්‍රමය හඳුන්වා දෙන ලදී. (.....) |
| 38. ලන්දේසීන් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික පරිපාලන ව්‍යුහය සුළු සුළු වෙනස්කම් සහිතව ස්වකීය අරමුණුවලට අනුකූල වන අයුරින් සකස් කරගන්නා ලදි. | ලන්දේසි සෑම දිසාවණියකම තිබූ කෝරළ පත්තු හා ගම් යන පාරම්පරික බෙදීම් ඒවා භාරව සිටි ප්‍රධාන නිළධාරීන් වූ මුදලිවරුන්, කෝරළවරුන් හා අතුකෝරාළවරුන් යටතේ දිගටම පවත්වාගෙන යන ලදි. (.....) |
| 39. පළමු විජයබාහු රජතුමා විසින් දැදුරු ඔය ස්ථාන තුනකින් හරස්කොට සුකරනිජ්ජර, දෝරදත්ත, කොට්ඨබද්ද නමින් අමුණු තුනක් බඳින ලදි. | ලන්දේසි ආණ්ඩුකාර ෆන් එංගල් බෙක් විසින් ගිවිසුමක් මගින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පාලන බලය ඉංග්‍රීසීන් වෙත භාරකරන ලදි. (.....) |
| 40. 1818 පළමු නිදහස් අරගලයේදී මොල්ලිගොඩ අධිකාරම හා එක්නැලිගොඩ නිළමේ තුමා ඉංග්‍රීසීන්ගේ පක්ෂය ගෙන කටයුතු කරන ලදි. | පෘතුගීසීන් යටතේ ලංකාවට පැමිණි වෙස්ලියන් මිෂනාරී සමාගම ලංකාවේ ආගමික ප්‍රචාරක කටයුතුවල නිරත විය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ...........................

# ලංකා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව ඓතිහාසික කෙටි සටහන් ලියන්න.

| | | |
|---|---|---|
| (i) දකුණු පළාත | (ii) නල්ලූර් | (iii) සූරකර තිත්ථ |
| (iv) කතරගම | (v) බලන | (vi) කළුගඟ |
| (vii) දඹදෙණිය | (viii) මින්නේරි වැව | |

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. ඓතිහාසික සටහනකට ලකුණු 5 බැගිනි)

02. අනුරාධපුර යුගය අවසානය දක්වා ශ්‍රී ලංකා ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී ප්‍රයෝජනවත් වන සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් කෙතෙක් දුරට සනාථ වේදැයි පරීක්ෂා කරන්න. (ල. 14)

03. වළගම්බා රජතුමා හා දුටුගැමුණු රජතුමා ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් පාලකයින් දෙදෙනෙකි. ඔවුන් දෙදෙනා සම්බන්ධ කාර්ය සංසිද්ධින්හි සමාන අසමානතා පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 14)

04. පළමු විජයබාහු රජුට හා පළමු පැරකුම් රජුට පසුව පෙළොන්නරුවේ සිට ලංකාව පාලනය කළ පාලකයින් අතර වැදගත්ම පාලකයා නිශ්ශංකමල්ල රජුය. නිශ්ශංකමල්ල රජුට පූර්වයෙන් හා පසුව පොළොන්නරුව පාලනය කළ පාලකයින්ගේ ක්‍රියාකලාපය පිළිබඳ අවධානය යොමු කරමින් නිශ්ශංකමල්ල යුගයේ ඇති වැදගත්කම පිළිබඳ විමසුමක යෙදෙන්න. (ල. 14)

05. රජරට ශිෂ්ටාචාරයේ පදනම කෘෂි කර්මාන්තයයි. රජරට ශිෂ්ඨාචාරයේ ආර්ථික කටයුතු පිළිබඳවත් ඒ සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබඳවත් අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 14)

06. දෙවන පරාක්‍රමබාහු රජුගේ කාර්යය සාපල්‍ය පිළිබඳ විස්තර කරන්න. (ල. 14)

07. 1848 කැරැල්ල ඇතිවීමට බලපෑ සාධක විස්තර කරමින් එම කැරැල්ල අසාර්ථක වීමට බලපෑ කරුණු පිළිබඳ විග්‍රහකය යෙදෙන්න. (ල. 14)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) කෝට්ටේ රාජධානිය පරිහානියට හා බිඳවැටීමට බලපෑ සාධක පිළිබඳ විමසුමක යෙදෙන්න.

(B) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ පැවති ලන්දේසි පාලන ක්‍රමය පහත දැක්වෙන මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

01. ලන්සේදි පාලනයේ අරමුණු
02. මධ්‍ය පාලනය
03. ප්‍රාදේශිය පාලනය (ල. 14)


09. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන ඒවායේ ඓතිහාසික වැදගත්කම පිළිබඳව විමසන්න.

(i) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
(ii) පෘතුගීසීන් හා උඩරට රාජධානිය පැවැත්වූ සබඳතා
(iii) සීතාවක රාජධානියේ ආරම්භය වර්ධනය හා පරිහානිය
(iv) ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපිත වීම හා ව්‍යාප්ත වීම

## තෙවන වාර පරීක්ෂණය - 2018
## ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය
### පිළිතුරු - 1 කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 5 | 11. | 2 | 21. | 4 | 31. | 2 |
| 2. | 1 | 12. | 5 | 22. | 1 | 32. | 1 |
| 3. | 4 | 13. | 1 | 23. | 5 | 33. | 3 |
| 4. | 2 | 14. | 3 | 24. | 2 | 34. | 5 |
| 5. | 3 | 15. | 4 | 25. | 2 | 35. | 3 |
| 6. | 4 | 16. | 1 | 26. | 4 | 36. | 3 |
| 7. | 5 | 17. | 3 | 27. | 2 | 37. | 2 |
| 8. | 2 | 18. | 5 | 28. | 3 | 38. | 5 |
| 9. | 1 | 19. | 2 | 29. | 5 | 39. | 4 |
| 10. | 4 | 20. | 4 | 30. | 1 | 40. | 1 |

### 11 කොටස.



01. සිතියම (ඓතිහාසික සටහන් සඳහා උචිත පරිදි ලකුණු ලබාදෙන්න.)

02. * ආගමික හා සංස්කෘතික තොරතුරු සනාථ වීම.
* මහින්දාගමනය - සාංචි ධාතු කරඬු පියනේ ලිපිය, අශෝක දෙවන ගිරි ලිපිය
රජගල, මිහින්තලේ ලිපි
වංස කතා වල සදහන් ඓතිහාසික ස්ථාන පුරාවිද්‍යා ලිපි මගින් තහවුරු වීම.
* දේශපාලන තොරතුරු
* රජවරුන් හා ඔවුන්ගෙන් සේවා - උත්තිය රජු, මිහින්තලේ ලෙස ලිපි
සන්ධාතිස්ස රජු - ලඤ්ජිතිස්ස - රජගල ලිපි
වසභරජු - වල්ලිපුරම් සන්නස, පෙරමියන් කුලම් ලිපිය
හැබැස්ස ලිපිය, තම්මැන්නා ලිපි
බුද්දපාරිලන්ද රජු - රුවන්වැලිසෑහුවරු ලිපි
* ඇමතිවරුන් හා රාජ්‍ය නිළධාරින් පිළිබඳ -ඇමතිවරු - පරමාකන්ද ලිපිය
භාණ්ඩගාරික - මිහින්තලය ලිපිය
ගණකවරු - මහ ඇළගමුව
* සෙන්පතිවරු (දසමහායෝධයන්) වැල්ඵලුල්ලු ගොඩකන්ද ලිපිය
මහ ඇලගමුව / සිතුල්පව්වලිපි
* ආර්ථික තොරතුරු
වෙළඳ ශ්‍රේණි පිළිබඳ - සැස්සේරුව ලිපිය
වෙළෙන්දන් පිළිබඳ - සැස්පේරුව
බදු වර්ග - ගොඩවාය (වරයා බදු)
වෙළෙද පොළ නීතිරීති - හෝපිටිගම

03. (i) * වලගම්බා රජතුමාගේ හා දුටුගැමුණු රජුගේ ඥාති සබදතාවය
* දුටුගැමුණු රජතුමාට රාජ්‍ය බලය ලබා ගැනීමේ දී තම සහෝදර යන යම් අභියෝගයක් එල්ල කළ බව.
* වළගම්බා රජතුමාට රාජ්‍ය බලය ලබා ගැනීමේදී හා ලබාගත් පසු අභියෝග රැසකට මුහුණ දීමට සිදුවූ බව
* ජෛන විරෝධය - සහෝදරියගේ දරුවන්ගේ කැරැල්ල
ගිරි නිගණ්ඨයාගේ ක්‍රියාකලාපය
රජවාසල කුමන්ත්‍රණ - මහාරක්තක සෙනෙවිගේ රාජ්‍ය පැහැර ගැනීම.
* රාජ්‍යත්වයට පත්වූ පසුව මුහුණ දුන් අභියෝග
බ්‍රාහ්මන විරෝධය - තීය බමුණගේ කැරැල්ල
සත්ද්‍රවිඩ ආක්‍රමණය
බැමිණිතියා සාගතය
* වළගම්බා රජුට රාජ්‍ය බලය නොමැතිව වනගත දිවියක් ගත කරමින් සාගතයක් පවතින අවධියක
* සේනා සංවිධානය කොට සත්ද්‍රවිඩයන් පරදවා රට එක්සේසත් කිරීමට සිදු වූ බව.
දුටුගැමුණු රජු තම පියාගේ මරණින් පසුව සහෝදරයා සමග ගැටුමක් ඇතිකරගත් අතර පියා සංවිධානය කරන ලද පහසුකම් ප්‍රයෝජනයට ගෙන සේනාව මෙහෙයවා එළාර පරදවා රජරට ජයගත්බව.
* පියා ඉටුකරන ලද මෙහෙය
- රෝහණය එක්සේසත් කිරීම.
- දසමහා යෝධයින්ගෙන් සැදුම් ලත් හමුදාවක් සංවිධානය
- භික්ෂූන් වහන්සේලාගේ සහයෝගය ලබා ගැනීම.
- රට අභරින් ස්වංපෝෂිත කිරීම.
- මහවැලි ගංගා තිරයේ ආරක්‍ෂා තර කිරීම.
- සහෝදරවරුන් අතර සුහදත්වය ආරක්‍ෂාවක අයුරින් කටයුතු කිරීම.

* වළගම්බා රජුට ඉහත සඳහන් පහසුකම් නොලැබීම.
* දුටුගැමුණු රජු රාජ්‍යත්වයට පත්වීමෙන් පසු මහා විහාරයට විශාල මෙහෙයක් ඉටු කිරීම.
* වළගම්බා රජුගේ අභයගිරි විහාර පූජාව නිසා මහා විහාරිකයින්ගේ දෝෂයට ලක්වීම.
ආදී තොරතුරු විස්තර කර ලිවීම.

04. * නිශ්ශංකමල්ල රජුට පූර්වයෙහි පාලනය කළ මහා විජයබාහු හා පළමු පැරකුම් රජුගේ ක්‍රියාකලාපයන් කෙටියෙන් පහදා තිබීම.

* නිශ්ශංකමල්ල රජුට පසුව පොළොන්නරුවේ රාජ්‍යත්වය පත් පාලකයින් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් කෙටියෙන් විස්තර කිරීම.
* නිශ්ශංකමල්ල රජුට රාජ්‍යත්වයට පත්වීමේදී මුහුණ දුන් අභියෝග විස්තර කර තිබීම.
* එම අභියෝග ජයගත් අන්දම විස්තර කර තිබීම.
* නිශ්ශංකමල්ල රජුට පසු පාලකයින්ගේ කටයුතු හා නිශ්ශංකමල්ල රජුගේ ක්‍රියාකාරකම් සැසඳීම.

05. (i) කෘෂිකර්මයේ විකාශය පිළිබඳ හැඳින්වීම.
හේන්ගොවිතැන - වී ගොවිතැන
කෘෂිකර්මාන්තයේ දියුණුවට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම.
වැව්, අමුණු, ඇළමාර්ග, ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය
උදාහරණ දෙමින් පැහැදිලි කිරීම.
රජරට ශිෂ්ටාචාරය හඳුන්වා තිබීම.
මුල් ජනාවාස කෘෂිකර්මාන්තයට උචිත ප්‍රදේශවල බිහිවූ බව.

06. **දේශපාලන වැදගත්කම**
චන්ද්‍රභානුගේ ආක්‍රමණ මර්දනය කිරීම.
කාලිංග මාඝ පරාජය පත් කිරීම.
චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණය මර්දනය කිරීම.
**ආගමික සේවය**
දඹදෙණි කතිකාවත සංඝ සංශෝධනය
වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය
පොළොන්නරු නගරය ප්‍රතිසංස්කරණය
මහවැලිගගේ දාස්තොට දී උපසම්පදා උත්සවයක් පැවැත්වීම.
රත්නපුර සමාන් දේවාලය ඉදිකිරීම.
දඹදෙණි දළදා මැදුර කරවීම.
**අධ්‍යාපන හා ශාස්ත්‍රීය නවෝදය**
පිරිවෙන් ඉදිකිරීම. උගතුන්ලවා සාහිත්‍ය කෘති රචනා කිරීම.
රජු නිර්මාණකරණයේ නිරත වීම. රජු උගතෙකු බව.
ආදිය විස්තර කර තිබීම.

07. **කැරැල්ලට හේතු :-**
1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය බලපෑ අයුරු
මුඩුබිම් පණත
චොරිස්ටන්සාමි වරයාගේ බහු ප්‍රතිපත්තිය
වතු වගාවන් නිසා ඇතිවූ සමාජ හා ආර්ථික ගැටළු
තිල්පොත සඳහා තොරතුරු රැස්කිරීම.
**කැරැල්ල අසාර්ථක වීමට හේතු :-**
පොදු ජන කැරැල්ලක් බව
සටන මනාලෙස සංවිධානය වී නොතිබීම.
ඉංග්‍රීසීන්ගේ මර්දනකාරී වැඩපිළිවෙළ
මාර්ග පද්ධතියේ දියුණුව
සිංහලයන්ට නවීන ආයුධ නොතිබීමත් ඉංග්‍රීසින්ගේ නවීන ආයුධවලට මුහුණදීමට නොහැකිවීම.

08. (A) * කෝට්ටේ රාජධානියේ දේශපාලන ඒකසත්භාවය බිඳී යාම.
* අටවන වීර පරාක්‍රමබාහු රජ දවස පාලන මධ්‍යස්ථාන පහක් යටතේ කෝට්ටේ රාජධානිය පාලනය වීම.
* 1521 සිදුවූ විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජධානිය කොටස් තුනකට බෙදීයාම.
* කෝට්ටේ හා සීතාවක රාජ්‍ය අතර ඇතිවූ ගැටුම්.
* හත්වන බුවනෙකබා රජුගේ ආගමික ප්‍රතිපත්ති නිසා, භික්ෂූන්, සිංහල බෞද්ධයින් සීතාවක රාජ්‍යයට සහාය ලබාදීම.
* සීතාවක රාජ්‍යයේ නැගී සිටීම.
* කෝට්ටේ රාජ්‍යයේ දේශපාලනය හැසිරවීමේ බලය පෘතුගීසීන්හට නතුවීම.
* ධර්මපාල රජු කතෝලික ආගම වැළඳගැනීම.
* කෝට්ටේ රාජ්‍ය තෑගි ඔප්පුවකින් පෘතුගීසීන්ට පැවරීම.
* පෘතුගීසීන් කෝට්ටේ අතහැර රජු සමඟ කොළඹකොටුවට පලායාම.
* මල්වානේ ගිවිසුම. * කෝට්ටේ රාජශ හා පෘතුගීසීන් අතර සබඳතාවය

(B) * ලන්දේසි පාලනය වෙළඳාමෙන් ලබා ලැබීම හා අගම ප්‍රචාරය කිරීම පදනම් කරගෙන සංවිධානය වූ බව.
* කොමාන්ඩරි ක්‍රමයේ ආරම්භය.
* කොළඹ, ගාල්ල, යාපනය යන කොමාන්ඩරි තුන හා ඒවා කොමදෝරුවරුන් යටතේ පාලනය වීම.
* වෙළෙඳ සමාගමක ප්‍රධානත්වයෙන් ගොඩනැගුණු පරිපාලන රටාව
* ඉහළම මණ්ලය පෙරදිග වෙළෙඳ සමාගම් අධ්‍යක්‍ෂමණ්ඩල වීම.
* බතාවියානු ආණ්ඩුකාරවරයා හා ඔහුගේ උපදේශක සභාව
* උසස් නතතුරු ලන්දේසියට හිමි වීම.
* ගාල්ලේ ආණ්ඩුකාරවරයා සහ ඔවුගේ උපදේශක සභාව
* ප්‍රාදේශීය පාලනයේදී දේශීය නිලධාරීන් යොදාගැනීම.

09. (i) * **කීර්ති ශ්‍රී රාජසිංහ රජු**
නායක්කාර වංශිකයෙකු බව
බුදු දහම වැළඳගන බෞද්ධයෙකු වූ බව.
බෞද්ධාගමික කටයුතු කරෙති දැඩි උනන්දුවකින් කටයුතු කිරීම.
රජුට එරෙහිව ඇතිවූ කුමන්ත්‍රණ
සියම් උපසම්පදාව පිහිටුවීම.
භික්ෂු කතිකාවක් කරවීම.
ලංකාපුර වෙහෙර විහාර ප්‍රතිසංස්කාරණය කරවා ඒවා ගම්වර පූජා කිරීම.
වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.

* **පෘතුගීසී හා උඩරට රාධානිය අතර සබඳතා**
ජයවීර රජු හා කරලියද්දේ රජු සමඟ පැවැත්වූ සබඳතා
එදිරිල්ලේ රාළගේ පෘතුගීසි විරෝධී සටන
දන්තුරේ සටන, බලන සටන
කුසුමාසන දේවිය, යමසිංහ රජු, කොණප්පු බණ්ඩාර යන අය පෘතුගීසීන් සමඟ පැවැත්වූ සබඳතා
සෙනරත් රජුගේ සාමකාමී පිළිවෙන - 1617 ගිවිසුම
රන්දෙනිවල සටන (1630)
ගන්නෝරුව සටන ( 1638)
දෙවන රාජසිංහ රජු ලන්දේසීන්ගේ සහය ලබාගත ලංකාවෙන් පෘතුගීනීන් පළවාහැරීම.

* **සීතාවක රාජධානියේ ආරම්භ වර්ධනය හා පරිහානිය**
1521 විජයබා කොල්ලයෙන් පහු ආරම්භවීම, මායාදුන්නේ ආරම්භක පාලකයා බව
ව්‍යාප්තියව පැවති ප්‍රදේශ
රයිගම ඈදගැනීම, කෝට්ටේ රාජ්‍ය සමඟ ඇතිකරගත් ගැටුම්
පළමු රාජසිංහ බලයට පත්වීම - මුල්ලේරියා සටන
පෘතුගීසීන් සමඟ ඇතිවූ ගැටුම්
මහනුවර රාජ්‍ය අල්ලා ගැනීම / කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශ අල්ලා ගැනීම.
පරිහානිය - * රාජසිංහ රජු ශිව ආගම වැළඳගැනීම.
* රාජය අනුප්‍රාප්තියෙකු නොමැති වීම.
* භික්ෂූන් වහන්සේලා හා ජනයා සීතාවක අතහැර මහනුවරට සංක්‍රමණය
* මහනුවර රාජ්‍යයේ වර්ධනය

04. ප්‍රශ්නය සඳහා උචිත අයුරින් ලකුණු ලබා දෙන්න. බුදු දහම ලැබුණු ආකාර ස්ථාපිත වූ ආකාරය හා ව්‍යාප්ත වූ අයුරු විස්තර විය යුතු